කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
**GENERAL WEATHER FORECAST FOR SRI LANKA**
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

**2020 ඔක්තෝබර් මස 15 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2020 ඔක්තෝබර් මස 14 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇති වේ.

නුවරඑළිය, මහනුවර, රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවලට මි.මී. 50 ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.

අනුරාධපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වැසි ස්වල්පයක් ඇති විය හැක.

දිවයින හරහා, විශේෂයෙන්ම උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලත් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත් විටින් විට හමන පැ.කි.මී (50-60) පමණ තද සුළං ඇතිවිය හැක.

**WEATHER FORECAST FOR 15 OCTOBER 2020**
**Issued at 12.00 noon on 14 October 2020**

Showers will occur at times in Western, Sabaragamuwa, Central and North-western provinces and in Galle and Matara districts.

Fairly heavy rainfalls above 50**mm** are likely at some places in Nuwara-eliya, Kandy, Rathnapura, Kegalle, Galle and Matara districts.

A few showers may occur in Anuradhapura and Hambantota districts.

Strong gusty winds about **(50-60) kmph** can be expected across the island, particularly in the Northern, North-central and North-western provinces, Trincomalee and Hambanthota districts and in the western slopes of the central hills.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2020 ඔක්තෝබර් මස 14 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| විශේෂ නිවේදනය |
| ඔක්තෝබර් මස 15 වන දින උදෑසන දක්වා මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදීම අනතුරුදායක වන අතර ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. |
| වැසි තත්ත්වය: |
| පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශ වල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. |
| සුළඟ: |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (35-45) පමණ වේ. මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැක. මීගමුව සිට පුත්තලම, මන්නාරම සහ කන්කසන්තුරේ හරහා මුලතිව් දක්වා වන මුහුදු ප්‍රදේශ වල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (55-60) දක්වා වැඩි විය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩි විය හැක. |
| මුහුදේ ස්වභාවය: |
| මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු විය හැක. මීගමුව සිට පුත්තලම මන්නාරම සහ කන්කසන්තුරේ හරහා මුලතිව් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු හෝ රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු වේ. |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
## Issued at 12.00 noon on 14 October 2020

| |
|---|
| **Special notice** |
| **Fishermen are informed that it will be dangerous to venture into the sea areas extending from Matara to Pottuvil via Hambanthota until 15th morning, October 2020. Naval and fishing communities are requested to be vigilant in this regard.** |
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at several places in the sea areas from Puttalam to Matara via Colombo and Galle . |
| **Winds:** |
| Winds will be South-westerly in the sea areas around the island and the wind speed will be **(35-45) kmph**.<br>Wind speed can increase up to **(60-70) kmph** in the sea areas extending from Matara to Pottuvil via Hambanthota and increase up to **(55-60) kmph** in the sea areas off the coast extending from Negombo to Mullativu via Puttalam, Mannar and Kankasanturai. Wind speed can increase up to **(50-55) kmph** in the other sea areas as well. |
| **State of Sea:** |
| The sea areas extending from Matara to Pottuvil via Hambanthota can be rough or very rough at times. The sea areas extending from Negombo to Mullativu via Puttalam, Mannar and Kankasanturai, can be fairly rough or rough at times. Other sea areas around the island will be fairly rough at times. |